**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය - 2023**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1** තත්ත්වාගණනය කළ මතය

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

## 1.4 විගණන විෂයය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකි ය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයය පථය ද පුළුල්කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනයකර භාවිතාකර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාලවකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත්කර ඇත.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොදු ලෙජරය විධිමත් ලෙස පවත්වාගෙන ගොස් නොතිබුණි. | ගිණුම් තැබීමේ අඩුපාඩු 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඉදිරිපත් කිරීමේදී නිවැරදි කිරීමට සටහන් කරගෙන ඇති අතර, මෙවැනි අඩුපාඩු ඇති නොවන ලෙස ගිණුම් පවත්වාගෙන යාමට විධිමත් වැඩ පිළිවෙලක් යොදා ඇතිබව දන්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලික පොත්පත් විධිමත් ලෙස පවත්වා ගෙනයාමට කටයුතු කළ යුතු ය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලෙජරය හා මූල්‍ය ප්‍රකාශන සැසඳීමේදී ලෙජර ගිණුම් හයක වටිනාකම රු.36,850,761 ක් ලෙස ද, මූල්‍ය ප්‍රකාශනවල එම ගිණුම් හයෙහි වටිනාකම රු.38,141,109 ක් ලෙස ද දක්වා තිබූ අතර, ඒ අනුව රු.1,290,348 ක වෙනසක් නිරීක්ෂණය විය . | ගිණුම් තැබීමේ අඩුපාඩු 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළකර ඉදිරිපත් කිරීමේදී නිවැරදි කිරීමට සටහන් කරගෙන ඇති අතර, මෙවැනි අඩුපාඩු ඇති නොවන ලෙස ගිණුම් පවත්වාගෙන යාමට විධිමත් වැඩ පිළිවෙලක් යොදා ඇති බව දන්වා තිබුණි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු ය. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂය තුළදී රාජගිරියෙහි නව ගොඩනැගිල්ලට අදාළ වාර්ෂික බදුකුලිය, ආරක්ෂක වියදම්, ජලය හා විදුලිය වියදම් වෙනුවෙන් අධිකරණ අමාත්‍යාංශය විසින් දරන ලද රු.6,615,760 ක මුදල ආදායම් හා වියදම් ගිණුමට ඇතුළත්කර නොතිබුණි. | මෙම වියදම් අධිකරණ අමාත්‍යාංශය මඟින් දරා තිබූ බව ලිඛිතව දන්වා නොතිබීම නිසා ගිණුම්වලට ඇතුළත් කිරීමට නොහැකි වූ බවත්, 2024 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී මෙම වියදම් පෙර වර්ෂයේ ගැලපුම්වලට ගිණුම්ගත කිරීමට සටහන් කරගත් බවත් දන්වා තිබුණි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු ය. |
| (ඇ) මඩකලපුව ශාඛාවේ සමාලෝචිත වර්ෂයේ පළමු කාර්තුවට අදාළව බදුකුලිය රු.300,000 ක් ගෙවා තිබූ නමුත්, ආදායම් වියදම් ගිණුමේ සමස්ත වාර්ෂික බදුකුලී වියදම රු.1,200,000 ක් වෙනුවට රු.1,500,000 ක් ලෙස දක්වා තිබීම නිසා ඌණතාවය රු.300,000 ක් වැඩියෙන්ද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වගකීම් යටතේ උපචිත කුලී රු.900,000 ක් වෙනුවට රු.1,200,000 ක් දක්වා තිබීම නිසා ජංගම වගකීම් රු.300,000 ක් වැඩියෙන්ද මන්නාරම ශාඛාවේ අවසන් කාර්තුවට අදාළව ගෙවිය යුතු බදුකුලිය රු.240,000 ක් ගිණුම්වලට ගෙන නොතිබීම නිසා ප්‍රවර්තන වර්ෂයේ ඌණතාවය හා ජංගම වගකීම් එම වටිනාකමින් අඩුවෙන්ද සඳහන් කර තිබුණි. තවද 2020 වර්ෂයට අදාළ රු.423,146 ක් වූ බදුකුලිය ප්‍රවර්තන වර්ෂයේ බදුකුලී ගිණුමට සටහන් කිරීමෙන් ඌණතාවය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේ අවසාන ගිණුම් පිළියෙළ කිරීමේදී ඒවා නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇති බව දන්වා තිබුණි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු ය. |
| (ඇ) වාර්ෂික සේවා ගිවිසුමක් වෙනුවෙන් ගෙවන ලද රු.141,450 ක් ද, ටෝනර් 03 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවන ලද රු.159,390 ක් සහ කාර්යාලය නව ස්ථානයකට රැගෙන ඒම නිසා කාර්යාලය පැවති ගොඩනැගිල්ලෙන් ඉවත් කරන ලද රු.183,639 ක් වටිනා ඇලුමිනියම් සවිකිරීම්වල එකතුව රු.484,479 ක් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් යටතේ දැක්වීම හේතුවෙන් ස්ථාවර වත්කම්වල අගය එම | 2024 වර්ෂයේ අවසාන ගිණුම් පිළියෙළ කිරීමේදී ඒවා නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇත. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු ය. |

වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. තවද ඉහත සඳහන් සේවා ගිවිසුම වෙනුවෙන් සහ ටෝනර් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවූ එකතුව රු.300,840 ක් වර්ෂයේ ආදායම් හා වියදම් ප්‍රකාශයට ගෙන නොතිබීමෙන් ඌණතාවය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල (රු) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ඉන්ධන සඳහා වියදම | 2,955,159 | ආයතනයේ වාහනය හා අමාත්‍යාංශයෙන් ලබාගන්නා ලද වාහනවලට අදාළ ඉන්ධන වියදම සහ කාර්යාලයේ නිලධාරීන්ට ගෙවන ලද ඉන්ධන දීමනාවට අදාළ තොරතුරු | රු.2,955,159 ක ඉන්ධන වියදම් තුල ආයතනය සතු අංක CAO 4458 දරන මෝටර් රථයට හා අධිකරණ අමාත්‍යංශයෙන් ලබා ගන්නා ලද වාහන සඳහා දරන ලද වියදම් ඇතුලත් වන අතර, විමර්ශන කටයුතුවලට අවශ්‍ය ඉන්ධන ලබාගැනීමේදී අදාළ ලියවිලි ගෙවීම් වවුචරයටම යා කර ඇති බව දන්වා තිබුණි. | විගණනයට අවශ්‍ය තොරතුරු ලබාදීමට කටයුතු කළ යුතු ය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම (රු) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 | | | |
| (i) 9.1 (ආ) පරිච්ඡේදය | මාණ්ඩලික තත්ත්වයේ නොවන නිලධාරීන් තිදෙනෙකු වෙත අවස්ථා 7ක දී එකතුව රු.331,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි. | කාර්යය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් විමර්ශන කාර්යයන් කරගෙන යාමේදී මාණ්ඩලික තත්ත්වයේ නොවන නිලධාරීන්ට අතුරු අග්‍රිම ලබාදීමට සිදු වූ බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ii) 9.1 (ආ) සහ මුදල් රෙගුලාසි 371 (5) | අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුව ද, නිලධාරින් 12 දෙනෙකු විසින් අවස්ථා 37 කදී ලබාගත් අතුරු අග්‍රිම පියවීමට දින 13 සිට 65 දක්වා කාලපරාසයක් ප්‍රමාදකර තිබුණි. | යම් ප්‍රායෝගික තත්ත්වයන් මත ප්‍රමාද වීම් සිදුව තිබුණ ද, ඉදිරියේදී එය විධිමත් කිරීම සඳහා ලිඛිත උපදෙස් ලබාදී ඇති බව දන්වා තිබුණි. | යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (iii) 9.1 (ඇ) සහ මුදල් රෙගුලාසි 371 (4) | ගණන්දීමේ නිලධාරියා විසින් වුව ද, නිශ්චිත හා අවශ්‍ය නොවන කාර්යයන් සඳහා අතුරු අග්‍රිම ලබා නොගත යුතු යැයි සඳහන් වුව ද, නිලධාරීන් හතර දෙනෙකු විසින් අතුරු අග්‍රිම ලෙස ලබාගත් රු.526,800 ක මුදල් වැය කිරීමකින් තොරව ආපසු ලබාදී තිබුණි. | මූලික විමර්ශන පැවැත්වීම සඳහා සංවිධාන කටයුතු සිදුකළ ද, ඇතැම් අවස්ථාවල එම කටයුතු අත්හිටුවීමට සිදු වූ අවස්ථාවලදී සම්පූර්ණ අත්තිකාරම් මුදල ආපසු පියවීමට සිදු වූ බව දන්වා තිබුණි. | යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ආ)මුදල් රෙගුලාසි | | | |
| 1646 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට ඊළඟ මාසයේ 15 වන දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුව ද, කාර්යාලය සතුව පවතින වාහනයේ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා එසේ ඉදිරිපත්කර නොතිබුණි. | 2024 වර්ෂයේ සිට දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා යාවත්කාලීන කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | | |

| | | | |
|---|---|---|---|
| (i)3 ඡේදය | වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවන් සෑම මාස 12 ක කාලසීමාවකට පසුව හෝ කිලෝමීටර් 25000 ක දුර ප්‍රමාණය ධාවනය කිරීමෙන් පසුව හෝ කළ යුතු වුව ද, එසේකර නොතිබුණි. | මේ වන විට වාහන ධාවන තත්වයේ නොමැති බැවින් වාහන ධාවනය කිරීමට අවශ්‍ය කටයුතු කිරීමෙන් පසු ඉන්ධන පරීක්ෂාවන් සිදු කිරීමට කටයුතු කරන බව දන්වාතිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ii) අංක 12/2003 iii හා 2016 අගෝස්තු 22 දිනැති චක්‍රලේඛයෙන් සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 12/2003 iv හා 2017 පෙබරවාරි 27 චක්‍රලේඛයේ 03 (ආ) (ඇ) | මහජන රැස්වීම්, සාකච්ඡා හා වෙනත් දේශන සමගාමී ක්ෂණික පරිවර්තන සඳහා පළමු පැයට ගෙවනු ලබන රු.500 ක ගාස්තුව වැඩිවන සෑම පැයකටම ගෙවිය යුතු වුවත්, කාර්යාලය විසින් විමර්ශන වැඩසටහන් 5 ක් සඳහා සහභාගී වූ භාෂා පරිවර්තකයින් 35 දෙනෙකු සඳහා වැඩ කළ පැය ගණන පදනම් කර නොගෙන දිනකට රු.4,500 බැගින් රු.243,000 ක මුදලක් ගෙවා තිබුණි. | මූලික විමර්ශන කමිටුවලට යොදා ගන්නා භාෂා පරිවර්තකයන් ක්ෂණික පරිවර්තනයත් විත්දිතයන්ගෙන් හා සාක්ෂිකරුවන්ගෙන් ලබාගන්නා ප්‍රකාශ, ලිඛිත පරිවර්තනයත් යන කාර්යයන් දෙකම සිදු කරනු ලබන අතර, පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා භාෂා පරිවර්තන සේවයත් ලබාගන්නා බැවින් එම පැය ගණන හා කාර්යයන් දෙකම වෙනුවෙන් මෙම ගෙවීම් සිදුකර ඇති බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඇ) 2022 අගෝස්තු 22 දිනැති අංක PED 05/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (i) 03 ඡේදය | ශ්‍රී ලංකාවෙන් පිටත විදේශ රටක රැකියාවක නිරතවීම සඳහා රාජ්‍ය ව්‍යවසායන්හි සේවයේ නියුතු සේවකයන්ට තම සේවා කාලය තුළ වසර 05 ක උපරිමයකට යටත්ව වැටුප් රහිත විදේශීය නිවාඩු ලබාදිය හැකි වුව ද, කාර්යාලයේ සේවය කළ නිලධාරිනියකට පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා මෙම චක්‍රලේඛය ප්‍රකාරව වැටුප් රහිත වසර 05 ක නිවාඩු ලබාදී තිබුණි. | නිවාඩු අනුමත කිරීමේදී ප්‍රමාද දෝෂයක් සිදු වී ඇති බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ii) 3.9 හා 3.13 ඡේද | 2023 ඔක්තෝබර් 02 දින විදේශගත වූ නිලධාරිනියක විසින් 2024 අප්‍රේල් 30 දින දක්වා චක්‍රලේඛය පරිදි විදේශ විනිමය ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබූ අතර, භාවිතයට අපේක්ෂිත අනේවාසික විදේශ මුදල් ගිණුම පිළිබඳ විස්තර හා එහි ප්‍රගතිය ඇතුළත් වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලයට හා අමාත්‍යාංශ ලේකම්වරයාට මාසිකව වාර්තා කළ යුතු වුව ද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අනේවාසික ගිණුමට මාසිකව මුදල් ප්‍රේෂණය කරන ලෙස අදාළ නිලධාරිනියට දැන්වූව ද, රැකියාවක් සොයා ගැනීමට නොහැකි වූ නිසා මේ දක්වා මුදල් එවීමට නොහැකි වූ බව දන්වා තිබුණු අතර, පවතින තත්ත්වය පිළිබඳව වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත හා අමාත්‍යාංශ ලේකම්වරයා වෙත කරුණු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඉ)මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 01/2021 හා 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර සඳහා වන ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ ඇමුණුම 1 හි 2 වන වගන්තිය | ක්‍රියාකාරී සැලැස්මක් සාක්ෂාත් කරගැනීම සඳහා සම්පූර්ණ කළ යුතු උපායමාර්ග, විශේෂිත ක්‍රියාකාරකම් සහ ක්‍රියාකාරකම් මාලාවක් ප්‍රකාශ කළ යුතු වුවත්, පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් හෝ ක්‍රියාවන් සඳහා ඉලක්ක අරමුණු සහ උපායමාර්ග දක්වා නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කිරීමට සටහන් කරගත් බව දන්වා තිබුණි. | යොමුගත මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඊ) සංස්ථා, මණ්ඩල හා රජයට අයත් සමාගම් සඳහා සන්නිවේදන පහසුකම් සැපයීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 02/2022 හා 2022 ජනවාරි 18 දිනැති චක්‍රලේඛයේ 02 ඡේදය | චක්‍රලේඛයට පටහැනිව කාර්යාලය විසින් නිලධාරීන් තිදෙනෙකුට ජනවාරි සිට අප්‍රේල් මස දක්වා රු.46,000 ක දුරකතන බිල්පත් සඳහා වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවන ලද දුරකථන බිල්පත් 2024 ජූලි මාසයේ දීමනා ගෙවීමේදී අඩු කර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (උ)2018 අංක 19 දරන ජාතික විගණන පනත | පනත ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව | 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව Secretary General, | යොමුගත පනත ප්‍රකාරව කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| 16(2) | ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | Constitutional Council වෙත යොමු කර ඇතිබව දන්වා තිබුණි. | යුතු ය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.11,545,375 ඌණතාවයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.5,816,253 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,729,122 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පුනරාවර්තන වියදම් සඳහා රජයෙහි දායකත්වය අඩුවීම සහ අලුත්වැඩියා වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්යාලය විසින් විමර්ශනය අවසන්කළ ලිපිගොනු 1883 ක් පුනර්ජීවන දීමනා ගෙවීම සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලය වෙත යවන ලද නමුත්, එම කාර්යාලය විසින් දෙසැම්බර් 31 වන විට ලිපිගොනු 206 කට අදාළව පුනර්ජීවන දීමනා ගෙවා තිබුණි. ඒ අනුව හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් දීමනා ගෙවීමේ ප්‍රගතිය සියයට 10 ක් වැනි අඩු මට්ටමක පැවතිය ද, ඒ සඳහා බලපෑ හේතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් පසුවිපරමක් සිදුකර නොතිබුණි. | අංක: OMP/VFS/053 දරන 2024.02.16 සහ 2024.03.20 දින ලිපි යොමු කරමින් මේ සම්බන්ධව පසු විපරමක් සිදු කළ අතර, ඉන් අනතුරුව පුනර්ජීවන දීමනා ගෙවීමේ ප්‍රගතියක් ඇති බව නිරීක්ෂණය වන බව දන්වා තිබුණි. | කාලීනව පසුවිපරම් කටයුතු කළ යුතු ය. |
| (ආ) එසේම විමර්ශන කටයුතු අවසන්කර ඒ සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයේ අනුකූලතා වාර්තාව ලබාගැනීමෙන් පසු මරණ සහතික නිකුත් කිරීමට හා දක්නට නොමැති බවට සහතිකය නිකුත් කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ලිපිගොනු 424 ක් පමණ යොමු | මේ සම්බන්ධයෙන් 2023 සැප්තැම්බර් 25 දින අමාත්‍යාංශයේ ලේකම්, රෙජිස්ට්‍රාර් ජනරාල් ඇතුළු පිරිසකගේ සහභාගිත්වයෙන් සාකච්ඡාවක් පැවැත් වූ අතර, අදාළ සහතික නිකුත් කිරීම වේගවත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමුකළ බව දන්වා තිබුණි. | පසුවිපරම් කටයුතු සිදුකිරීමට කටයුතු කළ යුතු ය. |

| | | |
|---|---|---|
| කළ ද, ඉන් වර්ෂය තුළ සහතික 60 ක් එනම් සියයට 14 ක් පමණක් නිකුත්කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් පසුවිපරමක් සිදුකර නොතිබුණි. | | |

**3.2** **මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලය 255 ක් වුව ද, එදිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 43 ක් විය. ඒ අනුව අධිකාරියෙහි පරිපාලන කටයුතු වෙනුවෙන් සෘජුවම දායකවන තනතුරු 41 කින් තනතුරු 23 ක් පුරප්පාඩුව පැවතිණි. | අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයෙන් අනුමැතිය ලබාගෙන 2023 වර්ෂයේදී නව බඳවාගැනීම් 23 ක් සිදුකළ අතර, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් හා බහුකාර්යය සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ඉතිරි තනතුරු සඳහා බඳවා ගැනීමට ඉල්ලුම් කළ ද, අයදුම්කරුවන් නොමැති වීම නිසා බඳවාගැනීමට අපොහොසත් වූ බව දන්වා තිබුණි. | කඩිනමින් පුරප්පාඩු පුරවාගැනීමට කටයුතු කළ යුතු ය. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 01/2021 හා 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර සඳහා වන අත්පොත 6.6 ඡේදය පරිදි ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාවේ කෙටුම්පත් විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුව ද, කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන 2024 මැයි මස 16 දින ඉදිරිපත් කර තිබුණි. | මුදල් අංශයේ පැවති නිලධාරීන්ගේ පුරප්පාඩු හේතුවෙන් ගිණුම් හා වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් සිදුවූ බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**4.2** **වාර්ෂික වාර්තාව**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 01/2021 හා 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර සඳහා වන අත්පොත 6.6 ඡේදය අනුව | මුදල් අංශයේ පැවති නිලධාරීන්ගේ පුරප්පාඩු හේතුවෙන් ගිණුම් හා වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් සිදුවූ බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

ගිණුම් වර්ෂය අවසාන වී මාස 05 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා විගණන වාර්තාව ඇතුළත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුව ද, 2022 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව 2024 ජුනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 4.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීම, පරිපාලනය හා කර්තව්‍ය ඉටු කිරීම පනතේ 11 කොටසේ (1)10 හි දැක්වෙන කාර්යභාරයන් ඉටු කිරීම සඳහා කාර්යාලයේ ප්‍රධාන අංශ දෙකක් වන සෙවීම් හා විමර්ශන සහ සන්නිවේදන හා සමාජ සම්බන්ධීකරණ අංශයන් සෘජුව සම්බන්ධ වුව ද, 2023 වර්ෂය සඳහා සකස්කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට එම අංශ මඟින් ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන් ඇතුළත්කර නොතිබුණි. | සෙවීම් හා විමර්ශන අංශය වෙත ස්ථිර සේවක මණ්ඩලයක් නොසිටි නිසාත්, සන්නිවේදන හා සමාජ සම්බන්ධීකරණ අංශයේ පවතින සේවක පුරප්පාඩු සඳහා සේවකයන් බඳවාගෙන නොතිබූ නිසාත් එම අංශ ක්‍රියාත්මක නොවූ බව දන්වා තිබුණි. | ආයතනයේ අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු ය. |
| (ආ)සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබූ වටිනාකම රු.5,415,000 ක් වූ කාර්යයන් 25 කට අදාළව කිසිදු කාර්යයක් වර්ෂය තුළ සිදුකර නොතිබුණි. | අංශ 3 කට අදාළ ප්‍රධානී තනතුරු වර්ෂය තුළ පුරප්පාඩුව පැවතීම නිසාත්, සවිස්තරාත්මක දත්ත පද්ධතියක් මුදල් අයකර ගැනීමකින් තොරව සකස් කර දීමට ICRC ආයතනය එකඟවීම නිසාත් සැලසුම් කළ පරිදි කාර්යයන් කිරීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කිරීමට වගබලා ගත යුතු ය. |
| (ඇ) සමාලෝචිත වර්ෂය තුළදී නීති, ප්‍රතිපත්ති සහ පර්යේෂණ ඒකකය විසින් රු.7,750,000 ක් වැයකර අදියර එක සහ දෙක යටතේ මූලික විමර්ශන පැවැත්වීම සඳහා ලිපිගොනු 7750 ක් පිළියෙල කිරීමට සැලසුම්කර තිබුණ ද, මින් වර්ෂය අවසාන වන විට රු.21,825,578 ක් වැයකර ලිපිගොනු 2832 ක් විමර්ශනය | රුපියල් 21,825,578 ක මුදල ලිපිගොනු 2832 ක් සකස් කිරීම සඳහා පමණක් නොවන අතර, මූලික විමර්ශන වලට පෙර, මූලික විමර්ශන අතරතුරදී හා මූලික විමර්ශන අවසන් කිරීම යන සියළු අදියරයන්වල දරන ලද සම්පූර්ණ වියදම බව දන්වා තිබුණි. | වියදම් අවම වන පරිදි ඇස්තමේන්තු සකස් කිරීමට වගබලාගත යුතු ය. |

| | | |
|---|---|---|
| අවසන්කර තිබූ අතර, ඒ අනුව ඇස්තමේන්තු කළ මුදලට වඩා සියයට 282 කින් සත්‍ය මුදල වැඩි වී තිබුණි. | | |
| (ඈ) එසේම රු.7,500,000 ක් වැයකර ලිපිගොනු 7500 ක් පරිවර්තනයකර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ලබාදීමට සැලසුම්කර තිබුණ ද, රු.135,590 ක් වැයකර ලිපිගොනු 279 ක් පමණක් පරිවර්තනය කර තිබූ අතර, මෙය වර්ෂය තුළ සැලසුම් කරන ලද කාර්යයයෙන් සියයට 4 ක පමණ අඩු මට්ටමක පැවතිණි. | ප්‍රමාණවත් භාෂා පරිවර්තකයින් නොමැතිවීම හා ලිපිද්‍රව්‍ය සහ ලිවීමේ කඩදාසිවල පැවැති දැඩි හිඟය හා මිල ඉහළ යාම හේතුවෙන් සීමාසහිතව පරිවර්තන කටයුතු කිරීමට සිදු වූ බව දන්වා තිබුණි. | වියදම් අවම වන පරිදි ඇස්තමේන්තු සකස් කිරීමට වගබලාගත යුතු ය. |
| (ඉ) වින්දිත සහ පවුල් සහය ඒකකය විසින් අතුරුදහන්වූවන්ගේ ගැටලු සම්බන්ධ සිවිල් සමාජ කණ්ඩායම සමඟ සංවාදයට පහසුකම් සැලසීම සඳහා රු.200,000 ක් වියදම්කර රැස්වීම් 8 ක් පැවැත්වීමට සැලසුම්කර තිබුණ ද, රු.175,000 ක් වැයකර රැස්වීම් 3 ක් පමණක් පවත්වා තිබුණි. | වින්දිත සහ පවුල් සහය ප්‍රධානි තනතුර පුරප්පාඩුව පැවතීම හා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම හේතුවෙන් 2023 වර්ෂයේදී පැවැත්වීමට සැලසුම්කර තිබූ රැස්වීම් ප්‍රමාණය විධිමත් පරිදි සම්පූර්ණ කිරීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | වියදම් අවම වන පරිදි ඇස්තමේන්තු සකස් කිරීමට වගබලාගත යුතු ය. |